# ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
# කර්මාන්ත හා ව්‍යවසායකත්ව හා සංවර්ධන අමාත්‍යාංශය
# තනතුරු පුරප්පාඩු

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් අතුරින් සුදුසුකම්ලත් හා අත්දැකීම් සහිත අපේක්ෂකයින් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. අධ්‍යක්ෂ (මූල්‍ය) (HM) (කොන්ත්‍රාත් පදනම මත)

**සුදුසුකම් හා පළපුරුද්ද:**

අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (ICASL) සාමාජිකත්වය හෝ කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ වරලත් ආයතනයේ සාමාජිකත්වය (CIMA) සහ සහතිකලත් සහ සංයුක්ත ගණකාධිකාරිවරුන්ගේ සංගමයෙහි සාමාජිකත්වය ලබා තිබීම. (ACCA)

හෝ

ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගණකාධිකරණය/ කළමනාකරණය/ වාණිජ්‍ය/ ආර්ථික විද්‍යාව පිළිබඳ මූලික උපාධිය සහ කළමනාකරණ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සහ

ඇ) අදාළ ක්ෂේත්‍රයේ රාජ්‍ය දෙපාර්තමේන්තු / සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වසර 15ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම

**මාසික වැටුප :**

HM - රු. 105,399/- (මූලික වැටුප) + රු. 17,800/- (ජීවන වියදම් දීමනාව) + රජයේ අනුමත දීමනා

**වයස :**

අවුරුදු 35 ට නොඅඩු සහ 50 නොවැඩි විය යුතුය. (අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර)

## 02. සහකාර අධ්‍යක්ෂ (මෙහෙයවීම්) (MM) තනතුරු 01 (කොන්ත්‍රාත් පදනම මත)

**සුදුසුකම් හා පළපුරුද්ද:**

අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය / වාණිජ්‍ය /සංඛ්‍යානය පිළිබඳ ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වසර 03 ක පළපුරුද්ද.

ආ) පළමු හෝ දෙවන පෙළ පන්ති සාමාර්ථයක් ලබා ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය හිමි වේ.

ඇ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් වැඩ කිරීමට හැකිවීම අත්‍යාවශ්‍යයි.

**මාසික වැටුප :**

MM - රු. 71,730/- (මූලික වැටුප) + රු. 17,800/- (ජීවන වියදම් දීමනාව) + රජයේ අනුමත දීමනා

**වයස :**

අවුරුදු 22 ට නොඅඩු සහ 45 නොවැඩි විය යුතුය. (අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර) .

**03. <u>ප්‍රසම්පාදන නිලධාරී - (JM) – තනතුරු 01 (කොන්ත්‍රාත් පදනම මත )</u>**

**<u>සුදුසුකම් හා පළපුරුද්ද</u>**

අ) ගණකාධිකරණය / කළමනාකරණය / වාණිජ්‍ය / ආර්ථික විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධිය ලබා තිබීම හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (ICASL) හෝ කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ වරලත් ආයතනයේ (CIMA) හෝ සහතිකලත් සහ සංයුක්ත ගණකාධිකාරිවරුන්ගේ සංගමයෙහි (ACCA) අන්තර් මාධ්‍ය විභාගය සමත්ව තිබිම හෝ ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සමත් වී තිබීම සමඟ සුදුසුකම් සැපිරීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථාවක, මණ්ඩලයක, ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

ආ) ප්‍රථම උපාධියෙහි පළමු හෝ දෙවන පෙළ පන්ති සාමාර්ථයක් ලබා ඇති සහ ව්‍යාපාර කළමනාකරණ ජාතික ආයතනයෙහි (NIBM) මූල්‍ය සහ කළමනාකරණ ගණකාධිකරණය හෝ සැපයුම් සහ ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කර තිබීම හෝ ශ්‍රී ලංකා ගණකාධිකාරණ ශිල්පීයන්ගේ සංගමයෙහි (AATSL) පූර්ණ සුදුසුකම ලබා ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය හිමි වේ.

ඇ) ඉංග්‍රිසි මාධ්‍යයෙන් වැඩ කිරිමට හැකිවීම අත්‍යාවශ්‍යයි.

<u>මාසික වැටුප</u>

JM – රු. 58,615/- (මූලික වැටුප) + රු. 17,800/- (ජීවන වියදම් දීමනාව) + රජයේ අනුමත දීමනා

<u>වයස</u>

වයස අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය (අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර)

**<u>අතිරේක ප්‍රතිලාභ;</u>**

- ✓ සේවක අර්ථසාධක / භාරකාරත්ව අරමුදලේ ප්‍රතිලාභ
- ✓ වාර්ෂික ලාභ මත ගෙවනු ලබන දිරි දීමනා
- ✓ ප්‍රවාහන දීමනා
- ✓ ත්‍යාග දීමනා

ඉහත තනතුර සම්බන්ධව උනන්දුවක් දක්වන අයදුම්කරුවන් තම අයදුම්පත් ඔබ ගැන විස්තර ලබාගත හැකි ඥාති නොවන දෙදෙනෙකුගේ නම්, තනතුරු හා දුරකථන අංක අයදුම්පත්‍රයට ඇතුලත් කොට තම වෘත්තීය සහ අධ්‍යාපන සහතික සහ සේවා සහතිකවල, සහතික කරන ලද පිටපත්ද සමඟ සිය අයදුම්පත **2025/11/24** දින හෝ එදිනට පෙර අයදුම්කරනු ලබන තනතුරේ නම ලියුම් කවරයේ ඉහල වම් කෙලවරෙහි සඳහන් කර **සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි** වෙත පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් ලැබෙන සේ එවිය යුතුය.

රාජ්‍ය අංශයේ සේවය කරන අපේක්ෂකයින් සිය අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානින් මඟින් එවිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. සුදුසුකම් ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරික්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි**
**ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය**
**අංක 12. මැක්සන්ස් ටවර්, ඇල්ෆ්‍රඩ් හවුස් ගාර්ඩන්, කොළඹ 03**
**දුරකථන : 011-2329295/2325364/2390645-8 ෆැක්ස් : 011-2320758**
**වෙබ් අඩවිය : www.ngja.gov.lk**